# නැමදුම් අත්හැරීම

දෙවියන්වහන්සේ ඔබව මවා ඔබට සෑම දේ ලබා දී ඇත  "ඔහුයි ඔබව නිර්මාණය කර පෙනීම ඇසීම හා හදවත ආදිය දයාද කර දුන්නේ, නමුත් ඔබ කෘතඥ වන්නේ ඉතා අල්පයෙනි. "
අල්-කුර්ආනය 67:23

සිට ගනිමින් නැමදුමේ යෙදීම නිසා නබි තුමාණන්ගේ පාදයන් ඉදිමී තිබුණි. ඒ ගැන විමසූ විට ''මාගේ ස්වාමියාට මා ස්තුතිපූරක සේවකයෙකු විය යුතු නොවේද?'' යැයි එතුමා විමසුවේ ය.

## ඔබට මැලි කමක් දැනේද?

ඔබට දිනකට පැය 24ක් ලබා දී ඉන් මිනිත්තු 30ක් පමණක් ඔහු වෙනුවෙන් වැය නොකිරීම වෙනුවෙන් ඔබේ මැවුම්කරුට විනිශ්ච දිනයේ දී ඔබට දිය හැකි නිදහසට කාරණා කුමක් වේද?

දිනක් නබි තුමාණන්  මෙසේ පැවසීය,''ආදම්ගේ දරුවන් විනිශ්ච දිනයේදී කාරණා පහක් මත ප්‍රශ්න කරනු ලබයි. ඔහුගේ ජීවිතය හා එය කෙසේ ගෙවුනෙහි ද යන්නත් ඔහුගේ යෞවන කාලය හා එය කෙසේ වැය කළේ ද යන්නත් ඔහුගේ ධනයත් එය කෙසේ ඉපයුවේ ද කුමකට වියදම් කළේ ද යන්නත් ලබාගත් දැනුම කෙසේ ප්‍රයෝජනයට ගෙන ක්‍රියාවට නැගුවේ ද යන්නත් විමසනු ලැබේ''

## ඔබ කාලකණ්ණි පුද්ගලයෙකු වනු ඇත

දෙවියන්වහන්සේ මෙසේ පවසයි
"මගේ මතකයෙන් කවුරුන් ඈත් වන්නේද නියත වශයෙන්ම ඔහුගේ ජීවිතය ඔහුට ඉතාමත් අමාරු වනු ඇත . අපි විනිශ්චය දිනදී ඔහුව අන්ධයෙකු වශයෙන් නැගිට්ට වන්නෙමු. එවිට ඔහු "මගේ දෙවියනේ! ඔබ කුමක් නිසා මාව අන්ධයෙකු වශයෙන් නැගිට්ට වූවෙහිද? මා (වරක්) හොඳින් ඇස් පෙනෙන්නෙකු වශයෙන් සිටියෙමි" යයි පවසනු ඇත. එවිට (අල්ලාහ්) "අපේ සළකුණු ඔබට පැමිණියා නොවෙද? ඒවා ඔබ (ගණනයට නොගෙන) අමතක කර දැම්මෙහිය. එබැවින් ඔබවද මෙදින අමතක කරන ලදී" . අල්-කුර්ආනය 20:124-6

## ඉන් වන්නේ ඔබ ඔබටම හානි කරගැනීමක් පමණි

දෙවියන්වහන්සේට ඔබේ නැමදුම්වත් වෙනත් කිසිදු දෙයකවත් කිසිවෙකුගෙන් අවශ්‍යතාවයක් නොමැත. සියළු ප්‍රශංසා ඔහුටමය! ඔහුගේ උපකාරය අවශ්‍යවන්නේ ඔබටයි

" දෙවියන්වහන්සේට (අල්ලාහ්ට) කෘතඥතාවය පුද කරනු. කවුරුන් ඔහුට කෘතඥතාවය පුද කරන්නේද එය ඔහුගේ ආත්මයටම හොඳක් වනු ඇත. කවුරුන් කෘතඥ නොවන්නේද නියත වශයෙන්ම අල්ලාහ් සියලු අවශ්‍යතාවයන්ගෙන් නිදහස්ය. සියලු ප්‍රශංසා වලට සුදුස්සා ඔහුය".  අල්-කුර්ආනය 31:12

## ඔබ අවිශ්වාසවන්තයෙකි

v1.04

බොහෝ ඉස්ලාමීය විද්වතුන්ගේ මතය අනුව නැමදුම් ඉටුනො-කරන්නා අවිශ්වාසවන්තයෙක් වනබව පහත නබි වදන පදනම් කර ගනිමින් පවසයි:

"අපත් ඔවුනුත් (විශ්වාස කරන්නන් හා නොකරන්නන්) වෙන් කරන සාධකය වන්නේ නැමදුමයි. ඊට පිටුපාන තැනැත්තා අවිශ්වාසවන්තයෙකි"

තවද, නබිතුමාගේ අනුගාමිකයින් නැමදුම හැර වෙනත් කිසිඳු ක්‍රියාවක් අත්හැරීම අවිශ්වාසවන්තයෙකුගේ ලක්ෂණයක් ලෙස සැළකුවේ නැත

# නිදහසට කාරණා

වේලාව නොමැතිවීම (රාජකාරි, පාඩම් කටයුතු, කාර්යබහුල බව ආදිය) - පැහැදිලි මුලාවකි. ඔබ නැමදුමට මූලිකත්වය ලබා දී නැත. දෙවියන්වහන්සේ ඔබේ කාලය හා කාර්‍යයන් වඩාත් සාර්ථක හා කාර්යක්ෂම වීමට ආශිර්වාද කරනු ඇත.

මගේ හදවත පිරිසිදුයි  දෙවියන්වහන්සේ පිරිසිදු හදවත ඇති අය කවුරුන්දැයි විමසා බලයි. ඔහු, ඔබේ නැමදුම් අපේක්ෂා කරයි. ඔබගේ ක්‍රියාවන් ඔබේ හදවතෙහි ඇති දේ ප්‍රතිරූපණය කරයි. වඩාත්ම සුපිරිසිදු හදවත සතු වූ මුහම්මද් නබි තුමාණෝ නිරතුරුවම නැමදුමෙහි යෙදුනේ ය.

මගේ එලාමය - එලාමය නිසි ලෙස සකස් නොකළේ නම් එය නිසි වේලාවට නාදවන්නේ ද නැත. ඔබේ චේතනාවන් පිරිසිදුව තබා සුන්නාව පරිදි නින්දට යන්න

මගේ පවුල/සැමියා/බිරිඳ/දෙමව්පියන්/මිතුරන් මාව වළක්වනවා - ''වෙනත් කිසිවෙකුට අවනත වීමට අල්ලාහ්ට අකීකරු විය යුතු නැත'' යැයි නබිතුමාණෝ පවසා සිටියා. ඔබව විනිශ්චය කරනු ලබන්නේ තනිවමය.

මම පව් කරනවා වැඩියි - කාලයත් සමග ඔබේ නැමදුම් ඔබව පාප ක්‍රියාවන් කිරීමෙන් මුදවා ගනියි. එබැවින් නමදින්න - ඔබ පාප ක්‍රියාවන් හි නියලෙන්නේ නැමදුම් ඉටු නොකරන බැවිනි. '' ඉෂා හා ෆජ්ර් නැමදුම්වල ප්‍රතිලාභයන් ඔවුන් දන්නේ නම් ඔවුන් (මසජිදයට) බඩගාමින් හෝ පැමිණෙනු ඇත.'' යන නබිවැකිය මෙනෙහි කර බලන්න

එම දුෂ්කර වූ තීරණාත්මක දිනයේ ඔබ ඔබේ ස්වාමියාට මුහුණ දීමේ දී නැමදුම් මඟහැරීම සම්බන්ධයෙන් ඔබට දිය හැකි නිදහසට කාරණා කවරේ ද?


More Information

p (+61) 3 9354-7500   w iisna.com/pamphlets   e shareislam@gmail.com

Donation De tail s (Every $1 AUD donated produces 15 pamphlets)

Bank Name Commonwe alth Bank   Account Pamphlet Project Australia
BSB 063620 Account 10532332   Swift (international) CTBAAU2S


# දේව නැමදුමෙහි වැදගත් කම



learn the basics

www.iisna.com/pamphlets

අවාසනාවකට, කෙතරම් වැදගත් වුවත් බොහෝ මුස්ලිම්වරු දේව නැමදුමෙන් වැළකී සිටිති. නැමදුමෙහි පරමාර්ථය වනුයේ දෙවියන්වහන්සේ සමඟ වූ සබඳතාව සවිමත් කර ගැනීමත්, ඔහුගේ ආශිර්වාදයන්ට ස්තුති කිරීමත්, ඔහුගේ මහිමය සිහිකිරීමත් ය. ශරීරයට ආහාර හා ජලය වැනි ශාරිරික අවශ්‍යතාවයන් ඇත්තාසේම මනසටත් වන්දනාවන්ගෙන් සමන්විත වූ අධ්‍යාත්මික අවශ්‍යතාවන් ඇත. ඉන් දේව නැමදුම වැදගත් වෙයි. කෙනෙකු මනා ශාරිරික සුවයෙන් පසුවුවත් අධ්‍යාත්මිකව ගත්කළ ඔහු මියගිය කෙනෙකු ලෙස ජීවත්ව සිටිය හැක

දෙවියන්වහන්සේව (අල්ලාහ්ව) මතක්වන පුද්ගලයෙකු හා එසේ නොවන පුද්ගලයෙකු අතර වෙනස ජීවත්වන්නෙකු හා මියගිය තැනැත්තෙකු ට සම වේ.'' යැයි නබි තුමාණෝ පවසා සිටී

දෙවියන්වහන්සේ මෙසේ පවසයි, "විශ්වාසවන්තයිනි! අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාගේ (ආරාධනාවට) සවන් දෙනු. එය ඔබට ජීවය ලබා දෙන්නේය." අල්-කුර්ආනය 8:24

# එහි වැදගත්කම

## දෙවියන්වහන්සේ සමඟ සෘජු සබඳතාව

''කෙනෙකු ඔහුගේ ස්වාමියාට වඩාත්ම සමිප වන්නේ දණ්ඩ නමස්කාරයේදී ය''

නැමදුම ඔබව දෙවියන්වහන්සේ සමග සම්බන්ධතාවයක් ඇති කරයි. නැමදුම යන්නෙහි අරාබි අර්ථය (අස්-සලාහ්) ''සම්බන්ධතාවය'' යන අරුථයෙන් සැදී ඇත්තකි.. දෙවියන්වහන්සේගේ දූතයා (මුහම්මද් නබි තුමාණන් '' ඔබගෙන් යමෙක් නැමදුමට සූදානම් වන්නේ නම්, ඔහු තම ස්වාමියා සමඟ සබඳතාවයක් පවත්වයි. එම නිසා ඔහුට එම කාර්යයට අවධානය යොමුකිරීමට ඉඩ ලබාදෙන්න. එම සබඳතාව බිඳනොදමන්න.'' යැයි පැවසුවේය.

## ඉස්ලාමයේ කුළුණකි

ඉස්ලාම් හි දෙවන ප්‍රධාන කුළුණ වන්නේ දේව නැමදුමයි. මුස්ලිම්වරයෙකුගේ දිවියේ නිරන්තයෙන්ම ඉටුකළ යුතු අනිවාර්ය වගකීමක් වනුයේ එයයි. වාතාවරණය කුමක් වුවත් නැමදුම් දිනපතා අනිවාර්යයෙන්ම ඉටුකළ යුතුය. දෙවියන්වහන්සේ එය සටනේ යෙදී සිටින්නන් හටත් අනිවාර්යය කර ඇත ... ! ඔහු

"ඔබගේ නැමදුම් (පුරුද්ද) තදින් ආරක්ෂා කර ගනු ඔබ (සතුරාට) බිය වුවහොත් ඇවිදිමින් හෝ වාහනය මත හිඳිමින් හෝ නමදිනු." අල්-කුර්ආනය 2:238-9

යුධ සමයේ තත්වය එසේ වෙත් නම් එසේ නොවන අවස්ථාවේදී එය කෙසේ විය යුතු ද ?

## සාර්ථකත්වය නැමදුම් මත රඳා පවති

'' විනිශ්ච දිනයේදී පුද්ගලයෙක්ගෙන් ඔහුගේ ක්‍රියාවන් අතුරින් මුලින්ම ප්‍රශ්න කරනු ලබන්නේ නැමදුම පිළිබඳව යි. එය නිසි ලෙස ඉටුකර ඇත්නම් ඔහු නිර්දෝශී පුද්ගලයෙකු වේ. එමෙන්ම සාර්ථක හා සුරක්ෂිත අයෙකු වේ . එහෙත් එහි අඩුපාඩු වෙත් නම් ඔහු ඉතා අවාසනාවන්ත පරාජිතයෙකි.'' යැයි නබි තුමාණන් පවසා ඇත.

# එහි වාසිය

## අකුසල් ක්‍රියාවන්ට පළිහකි

දෙවියන්වහන්සේගේ උපකාරය නොමැතිව අකුසලින් ආරක්ෂාවිමට නොහැකිය. දෙවියන්වහන්සේ මෙසේ පවසයි "නියත වශයෙන්ම නැමදුම (කෙනෙකුව) අවමන් ගෙන දෙන හා අධර්මිෂ්ඨ ක්‍රියාවන්ගෙන් වළක්වා හරින්නේය". අල්-කුර්ආනය 29 : 45
ඔබ දෙවියන්වහන්සේ ඉදිරියේ දිනකට පස්වරක් පෙනීසිටීනම් පාපක්‍රියා සඳහා ඉඩක් කෙසේ ලැබෙන්නේ ද ?

## ඔබේ ආත්මය සාරවත් කරයි

නැමදීම, ඔබේ නිර්මාතෘ සමඟ සන්නිවේදනයේ යෙදීමට ඇති ඔබේ ආධ්‍යාත්මික අවශ්‍යතාව සංසිඳුවයි. එය ඔබේ ආත්මය සාමයෙන් හා සතුටින් පුරවාලයි.
දෙවියන්වහන්සේ පවසයි,
"අල්ලාහ්ව (දෙවියන්වහන්සේව) මතක් කිරීම මගින් නිසැකවම ඔබගේ හදවතට තෘප්තිය ලබා දෙනු ඇත ." අල්-කුර්ආනය 13:28

## ඔබව නිරහංකාර කරයි

නැමදුමෙහි දි මුස්ලිම්වරයෙක් ඔහුගේ සිරුරේ උසස්ම හා වැදගත්ම අවයවය වන හිස පොළොව මත තබමින් '' මාගේ අධිපති කෙතරම් අංග සම්පූර්ණ ද? කෙතරම් උසස් ද? '' යැයි පවසයි. එවිට දෙවියන්වහන්සේගේ විශිෂ්ඨත්වය හා ඔබ ඔහුගෙන් යැපෙන බව වැටහීමෙන් ඔබේ උඩඟු බව හා අධිමානය තුරන් වි යයි. ඔහු පවසයි, "නැමදුමෙහි නිහතමානී විශ්වාසවන්තයින් නියත වශයෙ-න්ම ජයග්‍රාහකයින්ය." අල්-කුර්ආනය 23:1-2

මෙය ඔබට අත්විඳිය හැක්කේ නැමදුමෙහි යෙදෙන අවස්ථාවේ පවසන දේ පිළිබදව නිසි අවබෝධයකින් සහ එයට නිහතමානීව අවධානය යොමු කළහෙත් පමණි.

## පාපයන් සෝදා හරියි

සියල්ලන් ම වරදෙහි යෙදෙති, නමුත් දෙවියන්වහන්සේ පාපයන් සෝදා හැරීමේ මාර්ගයක් නැමදුම් තුළින් සළසා දී ඇත
දෙවියන්වහන්සේ පවසයි
"තවද නැමදුම ඉටු කරනු.... නියත වශයෙන්ම දැහැමි ක්‍රියාවන් මගින් පාපතර ක්‍රියාවන් පහ කර හරින්නේය". අල්-කුර්ආනය 11:114

දෙවියන්වහන්සේගේ දූතයාණෝ අලංකාර උදාහරණයක් අනුගාමිකයින් හමුවේ තැබුවේ ය. ''ඔබ යමෙකුගේ නිවසේ දොරටුව ඉදිරියෙන් ගංගාවක් තිබුණේ නම් එහි දිනකට පස්වතාවක් ස්නානය කරත් නම් ඔහු කෙරෙහි කිලිටක් වෙත් ද?'' යැයි ඇසූ විට අනුගාමිකයින් ''නැත'' යැයි පිළිතුරු දුන් විට ''එලෙසින්ම දෙවියන්වහන්සේ පස්වේල් නැමදුමෙන් පාපයන් සෝදා හරියි'' යැයි නබි තුමා පැවසුවේ ය

## ඔබේ ගැටළු විසඳයි

ඔබ දෙවියන්වහන්සේ සමඟ ඔබේ බැඳීම ශක්තිමත් කරගත් විට දෙවියන්වහන්සේ ඔහුගේ අනෙකුත් නිර්මාණයන් සමඟ ඔබේ ඇති බැඳීම් වර්ධනය කර දෙයි. ඉතා බල සම්පන්න වූ ඔහු ඔබේ නැමදුම් හේතුවෙන් ඔබේ ගැටළු සඳහා විසඳුම් සළසයි

දෙවියන්වහන්සේ පවසයි
"ඉවසීම හා නැමදුම මගින් පිහිට පතනු" අල්-කුර්ආනය 2:153

## මුස්ලිම්වරුන්ව එක්සත් කරයි

සමූහ වන්දනය මගින් මුස්ලිම්වරුන් අතරේ සහෝදරත්වය, සම තත්ත්වය හා එකමුතුබව ඇති කරයි. නැමදුම්කරුවන් එක් පෙළට උරින් උර ගැටී කුල ජාති වර්ණ උසස් - පහත් වත් පොහොසත්කම් පවුල් තත්වයන් යනාදි භේදයන් නොසළකා නැඟී සිටිමින් මිනිසුන් අතර වූ බාධක සියල්ල බිඳ දේවනැමදුම හේතුවෙන් එකමුතු වෙති.

# නැමදුම් අත්හැරීම

"ඕ මිනිසුනේ! ඉමහත් ත්‍යාගශීලීභාවයෙන් යුත් ඔබගේ දෙවියන් ගැන ඔබව රවටා දැමුවේ කිමෙක්ද?" අල්-කුර්ආනය 82:6

## ඔබ ඔබේ මැවුම්කරුට අකීකරු වීමකි

ඔබේ පැවැත්මෙහි එකම අරමුණ දෙවියන්වහන්සේට වන්දනය කිරීමයි. නමුත් එයට පිටුපාමින් ඔබ ඔබේ මැවුම්කරුට අකීකරු වන්නේය.
"ඉන්පසු ඔවුන්ගේ ස්ථානයට පත් වූ වෙනත් පරපුරක් නැමදුම අත්හැර දමා ඔවුන්ගේ කාම ආශාවන් අනුගමනය කළහ. එබැවින් ඔවුන්ව නිරයෙහි වීසි කර දමනු ඇත . කවුරුන් තමන්ගේ වරදට පසුතැවිලි වී විශ්වාස කර, දැහැමි ක්‍රියාවන් කරන්නෝද, ඔවුන්ව හැර". අල්-කුර්ආනය 19:59-60

"(නිරයේ සිටින මිනිසුන්ගෙන් මෙසේ විමසනු ලබන්නාහ): ඔබව කුමක් මගින් නිරයට ඇතුළු වීමට සැලැස්සුවේද? එවිට ඔවුන් 'අපි නමදින්නන්ගෙන් නොවූවෙමු' යයි පවසනු ඇත . " අල්-කුර්ආනය 74:42-43

## ඔබ ගුණමකුවෙකි

සමිප සබඳතාවයක් ඇතිකරගැනීමට ඔබේ මැවුම්කරු කළ ආරාධනය ඔබ ප්‍රතික්ෂේප කිරීම ඔබගේ මහත් ගුණමකු ක්‍රියාවකි